# ප්‍රසම්පාදන දැන්වීම ශ්‍රී ලංකා යුද්ධ හමුදාව

## රසායනික ද්‍රව්‍ය, තීන්ත මිලදී ගැනීම හා ජීව වෛද්‍ය උපකරණ අලුත්වැඩියා කිරීම් සඳහා කොන්ත්‍රාත් කරුවන්ගෙන් ලංසු කැඳවීම
## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - 2025 වසර

1 ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට අයත් පහත සඳහන් මිලදී ගැනීම් හා අලුත්වැඩියා සඳහා සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු සඳහා යුද්ධ හමුදා ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් මිළගණන් කැඳවනු ලැබේ .

අ. තෝරාගත් කොන්ත්‍රාත්කරුවන් විසින් සියළුම සැපයුම් මිලගණන් කැඳවීම් නිවේදනයෙහි සඳහන් ස්ථානයන් වෙත ප්‍රවාහනය කර භාරදිය යුතුය .

ආ. මේ සඳහා උනන්දුවක් දක්වන සැපයුම්කරුවන් වැඩකරන දිනවලදී උදේ 1000 පැයේ සිට සවස 1500 පැය දක්වා අයිතමය ඉදිරියෙන් දක්වා ඇති දිනයන් තුල බත්තරමුල්ල යුද්ධ හමුදා මූලස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යක්ෂක මණ්ඩලය වෙතින් (රථ වාහන ගාල්කරනු ලබන ස්ථානයේදී) ඒකී ලංසු ලබාගත හැකි අතර එක් එක් ටෙන්ඩර් අංක වෙනුවෙන් දක්වා ඇති ආපසු නොගෙවන අයදුම්පත් ගාස්තු ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ අධ්‍යක්ෂ මුදල් , ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, අකුරේගොඩ පාර, බත්තරමුල්ල වෙත මුදලින් ගෙවිය යුතුය . අයදුම්කරුවන් විසින් නිසි පරිදි අත්සන් කරන ලද ලංසුව නිල මුද්‍රාව තැබීමෙන් පසු ඉදිරිපත් කල යුතුය . ටෙන්ඩර් අඩංගු ලියුම් කවරයේ ඉහළ වම් ටෙන්ඩර් අංකය (DEME/2025/ ) දිනය සහ මිළ ගණන් විවෘත කරනු ලබන දිනය සඳහන් කළ යුතුය .

### ජීව වෛද්‍ය උපකරණ අලුත්වැඩියා සිදුකිරීම

| අනු අංකය | ටෙන්ඩර් හඳුනාගැනීමේ අංකය | විස්තරය | දේශීය/ විදේශීය | ප්‍රමාණය | | මිලගණන්පත් නිකුත් කරනු ලබන දිනයන් | ලංසු වැසීම හා විවෘත කරනු ලබන දිනය සහ වේලාව | ආපසු නොගෙවන අයදුම්පත් ගාස්තු මුදල රු: |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | DEME/LA/BIOMEDICAL/H/245086 | No 60150 Fluoroscopy System (Luminos Agile) | දේශීය | 1 | ගණනින් | 2025/03/06 සිට 2025/03/20 | 2025/03/21 - පෙව 1100 | 3,500.00 |

### රසායනික ද්‍රව්‍ය හා තීන්ත මිලදී ගැනීම

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | DEME/EXP/06/2025/02 | Chemical Items | දේශීය | 5 | ජේ:වි | 2025/03/06 සිට 2025/03/20 | 2025/03/21 - පෙව 1100 | 2,000.00 |
| 2 | DEME/EXP/06/2025/06 | 2K Paint Items | දේශීය | 28 | ජේ:වි | 2025/03/06 සිට 2025/03/20 | 2025/03/21 - පෙව 1100 | 2,000.00 |

2 ලංසු තැබීම දක්වා ඇති පරිදි ජාතික තරගකාරී ලංසු තැබීමේ ක්‍රියා පටිපාටිය හරහා සිදුකෙරේ .

3 මුද්‍රා තබන ලද ලංසු පිටපත් දෙකක් ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට හෝ එම ලිපිනයේ ඇති ටෙන්ඩර් පෙට්ටියට ලංසු වැසීමේ කාලය අවසන් වීමට පෙර තැම්පත් කළ හැකිය . අදාළ භාරගැනීම් කාලය අවසන් වූ වහාම ලංසු විවෘත වන අතර ප්‍රමාද ලංසු ප්‍රතික්ෂේප කෙරේ. ජාතික හැඳුනුම්පත හා සේවා ස්ථානයේ ලිපියක් සමග ලංසුකරුට හෝ ඔහුගේ නියෝජිතයෙකු හට ලංසු විවෘත කිරීම සඳහා සහභාගිවිය හැකිය .

සභාපති
දෙපාර්තමේන්තු සුළු ප්‍රසම්පාදන කමිටුව
යුධොපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාව
ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය
අකුරේගොඩ පාර
බත්තරමුල්ල

4 ලංසු ඉදිරිපත් කිරීම සඳහා සැපයුම්කරුවන් පහත සඳහන් සුදුසුකම් සපුරාලිය යුතුය . කාර්මික ඇගයීම් අවස්ථාවේදී අදාළ සුදුසුකම් සලකා බලනු ලැබේ .
අ. මූල්‍ය හැකියාව.
ආ. සතුටුදායක බදු ගෙවීමේ වාර්ථාව
ඇ. ප්‍රමාණවත් අලුත්වැඩියා කිරීම් හැකියාව
ඈ. ප්‍රමාණවත් අංගන පහසුකම්
ඉ. ප්‍රමාණවත් කාර්යමණ්ඩල කාර්මිකයින් හා තාක්ෂණික පහසුකම්
ඊ. ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ පිටපතක් හෝ පසුගිය වසර තුනක මෙහෙයුම්වාර්ථාව සමග සංස්ථා සහතිකයක්

5 දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවේ වැට් බදු සඳහා ලියාපදිංචි වී ඇති ලංසුකරුවන් මිල කැඳවීමේ නිවේදනය සමග වැට් බදු සඳහා ලියාපදිංචි වී ඇති සහතිකය ඉදිරිපත්කල යුතුය .

6 මිල කැඳවීම් නිවේදන ලබාගැනීම සඳහා ආයතනය වෙතින් බලය පැවරූ ලිපියක් රැගෙන ආ යුතුය .

7 අසම්පූර්ණ හා අවශ්‍ය ලේඛණ සාක්ෂි සමග නොමැති ලංසු ලේඛණ ප්‍රතික්ෂේප කරනු ලැබේ . දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සභාපති හට ඕනෑම ලංසුවක් පිළිගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමටත් මිළදීගනු ලබන ප්‍රමාණයන් තීරණය කිරීමටත් අයිතියක් ඇත .

8 ගිවිසුම් අත්සන් කිරීම සඳහා තෝරාගත් ලංසුකරුවන් හට ලියාපදිංචි තැපෑලෙන් දැනුම්දෙනු ලැබේ .

9 දේශීය සැපයුම්කරුවන් සඳහා ජේෂණපත් මගින් ගෙවීම් සිදුකරනු ලබයි .

10 උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට අවැසි වැඩි විස්තර ලබාගැනීම සඳහා දුරකථන අංක 011-3070478 වෙතින් ලබාගත හැකිය.

යුද්ධ හමුදාධිපති
ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය
අකුරේගොඩ පාර
බත්තරමුල්ල